**උතුරු ප.රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක : 25/2024** *සිංහල පරිවර්තනය*

මගේ අංක : **NP/07/10/04/78**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා,
උතුරු පළාත, යාපනය
2024.09.03

අමාත්‍යාංශයේ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේනතු ප්‍රධානීන්,
උතුරු පළාත.

**"<u>උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුර ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණිය සඳහා ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතා මත පදනම්ව උසස් කිරීම(2022)2024</u>**

2013.06.01 දින සිට බල පවත්වන අයුරින් උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද පළාත් තාක්ෂණික සේවය සේවා ව්‍යවස්ථාවයට අනුව උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණික නිලධාරී (සිවිල්) තනතුරේ පත්කිරීම සඳහා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවයි.

අදාලත තනතුර බලපවත්වත සේවා ව්‍යවස්ථාලෙට අනුව මෙම චක්‍රලේඛයේ දක්වා ඇති සියලුම සුදුසුකම් ඇති උතුරු පළාත් තාක්ෂණික නිලධාරී (සිවිල්) තනතුරට අයත් අපේක්ෂකයින්ට එම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.මෙම අයදුම්පත් කැඳවීම මඟින් උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවලින් 2022.12.31 වන දින පවතින අයුරින් කාර්යමණ්ඩල පුරප්පාඩුවලින් 60% ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතා මත සම්පූර්ණ කරනු ලැබේ. (සුදුසුකම් ලත් අය වුවද 2022.12.31 දිනට පසු විශ්‍රාම ගන්වනු අය ඇතුළුව) අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය **2024.09.30** වේ.

## 02. උසස් කිරීම සඳහා සේවා කොන්දේසි:-

2.1 මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම සහිතයි.දැනට බලපවත්වන සේවා ව්‍යවස්ථා සටහනට/බඳවාගැනීමේ පරිපාටියට අදාල වන කොන්දේසිවලට අදාළ වේ.

2.2 මෙම නිවේදනයට අනුව සුදුසුකම් ලත් අයදුම්කරුවන් සඳහා පුරප්පාඩු පිරවීම සඳහා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

2.3 මෙම චක්‍රලේඛයට අනුව අවශ්‍යතා 2022.12.31 වන දින හෝ ඊට ප්‍රථමයෙන් සම්පූර්ණ කළ යුතුය.

2.4 උතුරු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (පරිපාලනය) අංක NP/02/04/SLTS/Gen හා 2024.02.28 දිනැති ලිපියට අනුව 2022.12.31 වන දින පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව දහසයකි (16). මෙම අයදුම්පත්‍ර කඳවීම මඟින් පුරප්පාඩු 09ක් (60%) ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතාව මත පුරප්පාඩු සම්පූර්ණ කරේ.

2.5 මෙම පත්වීම් ලබාගන්නා අපේක්ෂකයින් උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**03. වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව **MN 7-2016** යන වැටුප් කාණ්ඩයට අයත් **රුපියල්.41,580 – 11 x 755 – 18 x 1,030- 68,425/-** වේ. නියමිත රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයට අනුකූලව මෙම තනතුරට අදාල ශ්‍රේණියේ(04 වන) වැටුප් පියවරේ පිහිටුවන අතර ඒ අනුව මූලික වැටුප රුපියල් 43,845.00 වේ.

**04. තනතුරු උසස්වීම සඳහා අයදුම් කිරීමට සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:-**

**4.1 වයස් සීමාව:-**

මෙම තනතුරෙන් උසස්වීම සඳහා අවම සහ උපරිම වයස් සීමාවක් නොමැත.

**4.2. සුදුසුකම්:**

(අ). අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා කාණ්ඩයේ (**MN-03-2016)**, **I** වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හයක් (**06)** සක්‍රිය සේවාව සහ සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර තිබිය යුතු අතර වැටුප් වර්ධක හයක් (**06**) උපයා තිබිය යුතුය.

(ආ). උසස්වීම් දිනට පෙර වසර පහක (05) කාලයක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඇ). අනුමත කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලියට අනුකූලව උසස්වීම් දිනට පෙර වසර හය (06) කාලය තුළ සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් හෝ ඊට වඩා උසස් මට්ටමක් ලබා තිබිය යුතුය.

(ඈ). අදාල කාලය තුළ 3වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඉ). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අංක 03/2019ට අනුව සහ උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අන්තර්ග්‍රහණය කරන පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවවේ චක්‍රලේඛ අංක 1/2020 යේ විධිවිධිනවලට අනුව විනය කටයුතු සම්බන්ධයෙන් ද සැලකිල්ලට ගත යුතුය.

**05. සාමාන්‍ය සුදුසුකම්:-**

අයදුම්කරුවන් ඉහත සඳහන් තනතුරේ රාජකාරීන් ඉටු කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.

**06. තනතුරු උසස්කිරීමේ ක්‍රමවේදය:-**

6.1. උතුරු පළාත් තාක්ෂණික සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, ආයතන සංග්‍රහය, උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා ආයතන ක්‍රියා පරිපාටි සංග්‍රහය යනාදී විධිවිධාන වලට අනකූලව තනතුර උසස්කිරිම සම්බන්ධයෙන් සැලකිල්ලට ගනු ලැබේ.

6.2 සේවා ව්‍යවස්ථාවයට අනුව නිවේදනයේ 10 වැනි ජේදයේ දක්වා ඇති පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර මෙම නිවේදනයේ ඉල්ලා ඇති පරිදි ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. නියමිත දිනට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව නිරීකෂණය වුවහොත් කිසිදු දැනුම්දීමකින් තොරව අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.3 තාක්ෂණ නිලධාරීන් (සිවිල්) විශේෂ ශ්‍රේණියට අනුමත කරන ලද පිරිස් සංඛ්‍යාවෙන් **2022.12.31** දිනට පිහිටා ඇති පරිදි මුළු පුරප්පාඩුවලින් (**60% - 09 සේවකයින්)** ජ්‍යෙෂ්ඨත්වය සහ නිපුණතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහළ අනුපිළිවෙල (**Merit Order)** මත පදනම්ව පුරවනු ලැබේ.

6.4 නිවේදනය මඟින් ඉල්ලුම් කරන ලද සියලුම සුදුසුකම් **2022.12.31** දින හෝ ඊට ප්‍රථමයෙන් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වන අතර සුදුසුකම් නොලබන අයගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.5 අයදුම් පත්‍ර නිර්දේශ කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා, අයදුම්කරු චක්‍රලේඛයේ සඳහන් පරිදි සියලුම සුදුසුකම් සපුරා ඇති බවට සෑහීමකට පත්වීමෙන් අනතුරුව ඉදිරිපත් කළ යුතුය.

6.6 අදාල අයදුම්පත් ඉදිරිපත් කරන අපේක්ෂකයන්ගේ අයදුම් පත් නිර්දේශ කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා/පත්වීම් බලධාරී තාක්ෂණ නිලධාරී (සිවිල්) සේවයේ විශේෂ බඳවා ගැනීම පරිපාටියේ සඳහන් කොන්දේසීන් වල සඳහන් උසස්වීමට අදාල සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය **මුල් ලිපිලේඛණ** සකස් කළ යුතුය. අවශ්‍ය ලියකියවිලි සැකසීමේ යම් ප්‍රමාදයක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වගකිව යුතු නොවේ.

6.7 තම සදුසුකම් සනාථ කරන සියලුම ලිපිලේඛණ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතු අතර එලෙස සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් නොකරන ලිපිලේඛණ කෙරෙහි කුමණ හේතුවෙන් ම හෝ සැලකිල්ලට ගනු නොලැබේ.

6.8 අයදුම් පත්‍ර නිර්දේශ කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා, අයදුම්කරු චක්‍රලේඛයේ සඳහන් පරිදි සියලුම සුදුසුකම් සපුරා ඇති බවට (උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවවේ චක්‍රලේඛ අංක 22/2021 ට ඔබ අවධානය යොමු කරවනු ලැබේ) මෙම කරුණු සම්බන්ධයෙන් සෑහීමකට පත්වීමෙන් අනතුරුව ඉදිරිපත් කළ යුතුය.

**07. අයදුම් කිරීමේ ක්‍රමය:-**

7.1 මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති පරිදි A4 (21cmx29cm) ප්‍රමාණයකින් යුත් කඩදාසියක පිටු දෙකක් පමණක් උපයෝගිකර ගනිමින් ,යොමු කළ යුතු විස්තර වලින් අංක 01 සිට 12 දක්වා පළමු පිටුවේ ද අංක 13 සිට 17 දක්වා කඩදාසියේ දෙවන පිටුවේ ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍ර සකස් කල යුතුය.

7.2 අදාල ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා නිවැරදිව පුරවා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නිසි ලෙස සම්පූර්ණ කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිවිපාක සඳහා අයදුම්කරුවන් වගකිව යුතුය.අයදුම්පත්‍රෙය් ඡායාපිටපතක් තමන් සන්තකයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.සම්පූර්ණ කරන අයදුම්පත්‍ර මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව තිබෙන බවට අපේක්ෂකයන් විසින් වගකිය යුතුයි.ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.3 ඉහත උසස්වීම් සඳහා අයදුම් කරන අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය (දැනට විශ්‍රාම ගන්වා අයදුම් කිරීමට සුදුසුකම් ඇති අය සඳහාද තමන් විශ්‍රාම යන විට තමන් සේවය කළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින්ද). දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ නොකරන ලද අයදුම්පත් භාරගනු නොලැබේ.

7.4 අයදුම්පත් එවිය යුතු ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "**උතුරු පළාත් තාක්ෂණික සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුර ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණිය සඳහා ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතා මත පදනම්ව උසස් කිරීම (2022)2024**" ලෙස සඳහන් කරමින් එවිය යුතුය.

7.5 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024 සෙප්තැම්බර් මාස 30** දිනට හෝ ඊට පෙර ලැබෙන අයුරින් ලියාපදිංචි තැපෑලෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් (විශ්‍රාමිකයින් තමන් අවසනයේ සේවය කල දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින්) "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කොවිල පාර නල්ලූර්, යාපනය"** යනු ලිපිනයට එවිය යුතුය. අවසන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේන බව අවධාරණය කරනු ලැබේ.

**08. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-**

අයැදුම්පත්‍ර සම්පූර්ණ කරන විට දැඩි අවධානයෙන් යුතුව නිවැරදි තොරතුරු ලබා දිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ රීති වලට අනුව ඕනෑම අපේක්ෂකයෙකු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර, පරීක්ෂණයේ අතරතුර හෝ පසුව සුදුසුකම් සපුරා නොමැති බවට අනාවරණ වුයේ නම් ඔහුට හිමි අපේක්ෂකභාවය එම අවස්ථාවේදී ම වලංගු වන බවත් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් ව්‍යාජ බවට සනාථවන අවස්ථාවේ දී පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කළ හැකිය.

**09.** අයදුම්කරුගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු ශ්‍රී ලංකික විදේශ ගමන් බලපත්‍රය (Passport)

(iii) වලංගු රියදුරු බලපත්‍රය (Driving License)

**10. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:-**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් විෂයන් සඳහා ලකුණු පිරිනමනු ලැබේ. (සම්පූර්ණ ලකුණු සංඛ්‍යාව 100)

| අංකය | ලකුණු පිරිනමන විෂය පථය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | **සේවා පළපුරුද්ද**<br>අදාළ මූලික සුදුසුකම් ඉක්මවා සපුරන ලද සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක්. | ලකුණු 50 |
| 02 | **කුසලතාව**<br>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදාල අවස්ථාවේ අනුමත කරන ලකුණු ක්‍රමය මත කුසලතා තීරණය කරනු ලැබේ. | ලකුණු 45 |
| 03 | සම්මුඛ පරීක්ෂණයේදී කුසලතා පෙන්වීමේ හැකියාව | ලකුණු 05 |
| **සම්පූර්ණ ලකුණු** | | ලකුණු **100** |

**11.** මෙම නිවේදනයේ සඳහන් කර ඇති හෝ සඳහන් නොකළ කරුණු සම්බන්ධයෙන් අදහස් කරන හෝ අදහස් නොකරන ලද කරුණු පිළිබඳව යම් අපැහැදිලි භාවයක් සම්බන්ධයෙන් වෙනස්කම් සිදුකිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ගනු ලබයි. එසේම කිසියම් විශේෂ හේතුවක් නිමිත්තෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි වන අවස්ථාවක දී ඒ සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ගන්නා තීරණය අවසාන තීරණය වනු ඇත.

**12.** මෙම තනතුර සඳහා පුරප්පාඩු සම්පූර්ණ කරන විට එම පුරප්පාඩුවේ කොටසක් හෝ සම්පූර්ණයෙන් පිරවීම පිළිබඳ අවසන් තීරණය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ගනු ලැබේ.

13.මෙම චක්‍රලේඛයේ භාෂා මාධ්‍යයන් අතර යම්කිසි අනුකූලතාවයන් දක්නට ලැබෙන අවස්ථාවකදී දෙමළ භාෂා මාධ්‍යයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කල යුතුය.

**සටහන:-**

**2022.12.31 දිනට පසු සේවය කර විධිමත් පරිදි විශ්‍රාම ගත්වූ නිලධාරීන් (විනය නියෝග මත විශ්‍රාම නොගිය අය) මෙම උසස්වීම සඳහා සුදුසුකම් ලබා ඇත්නම් ඔවුන්ගේ අයදුම්පත් ද විධිමත් පරිදි ඔවුන්ව දැනුවත් කර එවැනි පුද්ගලයින් විසින් භාර දෙන ලබන අයදුම්පත් නිර්දේශයන් සහිතව සහතික කර යොමු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් සැලකිලිමත් විය යුතුය.**

**සී. තිරුවාකරන්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
03.09.2024

පිටපත් :- 1. ප්‍රධාන ලේකම්, උතුරු පළාත. - කා.දැ.පි.
2. ආණ්ඩුකාරවර ලේකම්, උතුරු පළාත - කා.දැ.පි.